376 PEI

පේරාදෙණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

# නොවිධිමත් අධ්‍යාපනය, එහි ක්‍රියාකාරීත්වය සහ ගැටළු පිළිබඳ කෑගල්ල දිස්ත්‍රික්කය ඇසුරින් කරන ලද විමර්ශනාත්මක අධ්‍යයනයක්

# A Study of Non Formal Educational Activities and Problems in the Kegalle District

එම්.ඩී.එස්.පීරිස්.

බී.ඒ. (ගෞරව ) අධ්‍යාපන ඩිප්ලෝමා (සම්මාන)

1997

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන අංශයේ

අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා

ඉදිරිපත් කෙරෙන පර්යේෂණාත්මක නිබන්ධනය.

පර්යේෂණ උපදේශක

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන අංශයේ

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය එල්.ඒ.කොබ්බෑකඩුව මහත්මිය

522222

<u>සාර සංග්‍රහය</u>

විධිමත් පාසල් අධ්‍යාපනයේ අසම්පූර්ණතාව සම්පූර්ණ කරදීම සඳහා වෙනත් අධ්‍යාපන අංගයක අවශ්‍යතාව අධ්‍යාපනඥයන් විසින් පිළිගෙන ඇත. මෙම තත්වය යටතේ එම අරමුණ ඉටුකරගැනීම සඳහා උපයෝගී කොට ගතහැකි අනුපූරක අධ්‍යාපන මාර්ග වෙත අදාළ බලධාරීන්ගේ අවධානය වැඩි වැඩියෙන් යොමුවන පරිසරයක් නිර්මිතව පවතී. මෙම පරිසරය තුළ වඩාත් ප්‍රබල දායකත්වයක් දක්වන අධ්‍යාපන මාර්ගය ලෙස "නොවිධිමත් අධ්‍යාපනය " ඉස්මතු වී පවතී. අධ්‍යාපන ක්‍රියාවලියේදී නොවිධිමත් අධ්‍යාපන මාර්ගය වෙත පැමිණෙන එම වැදගත්කම මතුකර දැක්වීමට මෙම අධ්‍යයනයෙන් ප්‍රයත්න දරා ඇත.

අධ්‍යාපන ක්ෂේත්‍රයට ගැනෙන විධිමත්, අවිධිමත් සහ නොවිධිමත් යන අංශ පිළිබඳව පෙර අපර දෙදිග විවිධ අධ්‍යාපනඥයින් සහ දාර්ශනිකයින් විසින් ඉදිරිපත් කොට ඇති නිර්වචන මෙම අධ්‍යයනය මගින් විමසුමකට ලක් කොට තිබේ. එමගින් සමස්ථ අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධයක් පාඨකයින් වෙත සපයා දී ඇති අතර එම අංග අතුරෙන් මෙම අධ්‍යයනයේ විෂය ක්ෂේත්‍රය වන නොවිධිමත් අධ්‍යාපනය යටතට ගැනෙන මූලික ලක්ෂණ හඳුන්වා දීමට පියවර ගෙන ඇත.

අධ්‍යයනයේ මීලඟ පියවර වශයෙන් සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවත්නා යන දෙකොටසට අයත් රටවල් අතුරින් තෝරාගත් රටවල් කීපයක ( ශ්‍රී ලංකාවද ඇතුළුව ) ක්‍රියාත්මක කෙරෙන නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් පිළිබඳව සිදුකළ සාර්ව විසඳුමක ප්‍රතිඵල ඉදිරිපත් කොට ඇත. එමගින් විවිධ සමාජ, ආර්ථික පරිසරයන් තුළ ක්‍රියාත්මකව පවත්නා විවිධ නොවිධිමත් අධ්‍යාපන ක්‍රියාකාරකම් හඳුන්වා දේ. අධ්‍යයනයේ විෂය ක්ෂේත්‍රය තුළ පවත්නා පුළුල් විවිධත්වය, ඒ ආශ්‍රිත සීමා මෙන්ම එහි විභවතාව පිළිබඳ අදහසක් පාඨකයින් වෙත සැපයීමට මෙම ප්‍රයත්නය උපයෝගී කොට ගෙන ඇත.

විෂය ක්ෂේත්‍රයේ අන්තර්ගත එකී ගුණාංග පිළිබඳව අවබෝධයක් ලබා දීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ පෝරාගත් දිස්ත්‍රික්කයක් වන කෑගල්ල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කෙරෙන නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් වල ස්වභාවය සහ එම ක්ෂේත්‍රයේ පවත්නා ගැටළු හඳුන්වා දීමට පියවර ගෙන ඇත. මේ සඳහා අධ්‍යයනය සිදුකළ ප්‍රදේශය තුළ නොවිධිමත් ක්‍රියාකාරකම් වල නිරතව සිටින රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතනද ස්වාධීනව ගෙන එම ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් අධ්‍යයනය කොට ඇත. මේ සඳහා ක්ෂේත්‍ර සමීක්ෂණයක් උපයෝගී කොට ගෙන එම ආයතන වල නිලධාරීන්, අදාළ අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කරන උපදේශක වරු මෙන්ම එම වැඩසටහන් වලට සහභාගී වන ප්‍රතිලාභීන් වෙතින් අවශ්‍ය තොරතුරු සපයාගෙන ඇත. මෙම තොරතුරු සපයාගැනීම, සම්මුඛ සාකච්ඡා, පෞද්ගලික නිරීක්ෂණ සහ ප්‍රශ්න මාලා උපයෝගී කොට ගනිමින් සිදුකොට ඇති අතර එම උපාය මාර්ග වලට අමතරව අදාළ ආයතන විසින් පවත්වාගෙන යනු ලබන ලිපි ලේඛනද පරීශීලනය කෙරිණි.

මෙම ක්ෂේත්‍ර සමීක්ෂණය ඇසුරින් දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කෙරෙන නොවිධිමත් අධ්‍යාපනික වැඩසටහන් වල පවත්නා ගැටළු සහ ඒවා පවත්නා ක්ෂේත්‍ර හඳුනාගෙන ඇති අතර, අදාළ වැඩසටහන් වල ප්‍රතිපත්ති, සැලසුම්කරණය හා සංවිධානය, මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පාලනය යන ක්ෂේත්‍රයන්හි ගැටළු පවත්නා බව අනාවරණය කොට ඇත.

නොවිධිමත් අධ්‍යාපනික ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීත්වය, එහි සීමා සහ විභවතාවය පිළිබඳව ජාත්‍යන්තර ක්ෂේත්‍රය තුළින් උකහාගත් අත්දැකීම්ද ප්‍රයෝජනයට ගනිමින් කෑගල්ල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කෙරෙන නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් වල පවත්නා එම ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා උපයෝගී කොටගතයුතු ක්‍රියා පිළිවෙත පිළිබඳ යෝජනා මෙම අධ්‍යයනය අවසානයේදී ඉදිරිපත් කොට ඇත.